# දේශීය වෙළඳපොල තුළ ගුණාත්මකභාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය

වාර්තාවේ අංකය : TEC/B/SLSI/1/19/PAU/37

## ජාතික විගණන කාර්යාලය

## IMT අංශය

## පටුන


| | | | පිටු අංකය |
|---|---|---|---|
| **01** | | **විධායක සාරාංශය** | 01 |
| **02** | | **පසුබිම** | |
| | 2.1 | හැඳින්වීම | 02 |
| | 2.2 | මාතෘකාව තෝරාගැනීමට හේතුව | 04 |
| | 2.3 | විගණන සඳහා අධිකාරී බලය | 04 |
| | 2.4 | විගණන අරමුණු | 04 |
| | 2.5 | විගණන නිර්නායක | 05 |
| | 2.6 | විෂය පථය | 05 |
| | 2.7 | සම්බන්ධිත ආයතන | 06 |
| **03** | | **විගණන නිරීක්ෂණ** | |
| | 3.1 | **ආයතනික පසුබිම හා සූදානම** | |
| | 3.1.1 | නෛතික පසුබිම | 06 |
| | 3.1.2 | ආයතනික ක්‍රමවේදය | 09 |
| | 3.1.3 | ආයතනික සැලසුම් | 10 |
| | 3.2 | **ආයතනයේ ක්‍රියාකාරිත්වය** | |
| | 3.2.1 | රසායනාගාර වාර්තා නිකුත් කිරීම | 11 |
| | 3.2.2 | නිෂ්පාදන සහතික ලාංඡනය ( SLS සහතිකය) ලබා ගැනීම | 12 |
| | 3.2.3 | ප්‍රමිති භාවිතය | 13 |
| | 3.2.4 | අලෙවි හා ප්‍රවර්ධන කටයුතු | 13 |
| | 3.3 | **සාධාරණ වෙළඳපොලක් සඳහා පසුබිම නිර්මාණය වීම** | |
| | 3.3.1 | ප්‍රතික්ෂේප වූ භාණ්ඩ | 14 |
| | 3.3.2 | භාණ්ඩ වල ප්‍රමිතියේ ගැටළු නිසා මතුවි ඇති තත්ත්වයන් | 17 |
| | 3.3.2.1 | ගෑස් සම්බන්ධ නියාමනය | 17 |
| | 3.3.2.2 | ආනයනික කිරිපිටි | 18 |
| | 3.3.2.3 | පෝසිලේන් | 19 |
| | 3.3.2.4 | ධාන්‍යමය ආහාර | 19 |
| **04** | | **නිර්දේශ** | 20 |
| | | **ඇමුණුම්** | |

**විධායක සාරාංශය**

**--------------------**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ ලංකා ප්‍රමිති කාර්යාංශය නමින් පිහිටුවා තිබුණි. 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් ලංකා ප්‍රමිති කාර්යාංශ පනත අවලංගු කොට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවා තිබූ අතර එහිදි ප්‍රමිති ප්‍රචලිත කිරීමේ සහ ශ්‍රී ලංකාවේ තත්ත්ව කලමනාකරණ පරිචයන් සඳහා සවිබල ගැන්වීම් ලබා දී තිබුණි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් SLS ලාංඡනය ලබා දීම, ආනයන භාණ්ඩ වල තත්ත්වය පරීක්ෂාව, රසායනාගාර සේවා සැපයීම, ශ්‍රී ලංකා ප්‍රමිති පිළියෙල කිරීම, ප්‍රමිතකරණය හා කර්මාන්ත වල තත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම, පුස්තකාල සේවාව පවත්වා ගැනීම තත්ත්ව පාලනය පිළිබඳ සහතික ලබා දීම යනාදී සේවාවන් සපයනු ලබයි. මෙම සේවාවන් සැපයීම සඳහා හා පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනීම සඳහා ආයතනය විසින් අනු ශාඛා 12කට බෙදා පවත්වාගෙන යනු ලබයි. එම අංශ භාණ්ඩ සහතිකකරණ අංශය, පද්ධති සහතිකකරණ අංශය, අලෙවි හා ප්‍රවර්ධන අංශය, විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය, ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය, තත්ත්ව සහතිකකරණ අංශය, පුහුණු අංශය, මූල්‍යය අංශය, ලේඛන හා තොරතුරු අංශය, පරිපාලන අංශය, රසායනාගාර අංශය, තොරතුරු තාක්ෂණ අංශය හා අභ්‍යන්තර විගණන ඒකකය ලෙස නම් කර පවති.

පාරිභෝගිකයාට ගුණත්වයෙන් ඉහළ භාණ්ඩයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සතු කාර්යභාරයට අනුව ආයතනයට ඉහළ පිළිගැනීමක් පවතී. ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන නිෂ්පාදකයින් සඳහා ක්‍රමවේදයකට අනුව ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා දීමත්, ආනයන භාණ්ඩ වල තත්ත්ව පරීක්ෂා කර ඒ පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබාදීමත් ආයතනය විසින් සිදුකරන ප්‍රධාන කාර්යයන් අතර වේ.

භාණ්ඩයක අඩංගු විය යුතු නිර්ණායක නියමිත ප්‍රමාණයන්ගෙන් නියමිත මාත්‍රාව අනුව තිබීම ආරක්ෂාවට හා සෞඛ්‍ය තත්ත්වයට ඉතා වැදගත් වේ. එලෙස ආරක්ෂිත හා සෞඛ්‍ය ගැටළු රහිත භාණ්ඩ පාරිභෝජන ජනතාවක් සිටින රටක සංවර්ධනය ඉතා ඉහල මට්ටමක පවතියි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ ද සෞඛ්‍යාරක්ෂිත ආහාර පරිභෝජනයට හුරු වීම තුළින් රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට හැකියාව පවතියි. ඒ සඳහා දේශිය නිෂ්පාදකයින් දිරිගැන්වීම නිරන්තරයෙන් සිදු කළ යුතුය. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට කළ හැකි කාර්යභාරය ඉතා වැදගත් වේ. ඒ සඳහා 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් විධිවිධාන සපයා ඇත.

එසේ වුවද පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරිම හා පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනිම සම්බන්ධයෙන් ප්‍රමිති ආයතනය කටයුතු කර ඇති ආකාරය පරීක්ෂා කිරීම සඳහා මෙම කාර්යසාධන විගණනය සිදුකර ඇත.

ඒ අනුව ආනයනික භාණ්ඩ පරීක්ෂාවේදී පරීක්ෂණ වාර්තා නිකුත්වීමට ප්‍රථම භාණ්ඩ වෙළඳපොලට නිකුත් වූ අවස්ථා, ප්‍රමිති සහතිකය නිකුත් කිරීමේදී සිදුව ඇති දූර්වලතා, කළමනාකරණ දූර්වලතා, රසායනාගාර පරීක්ෂණ සිදුකිරිමට ප්‍රමාද වීම, වෙළඳපොල පරීක්ෂාවන් සිදුකිරිම අවම මට්ටමක පැවතීම, ප්‍රමිති භාවිතය පිළිබඳ දැනුවත් කිරීම අවම වීම, පරීක්ෂණ වාර්තා අසමත් වූ භාණ්ඩ සම්බන්ධව

විධිමත්ව කටයුතු කිරීමට අපොහොසත් වීම යනාදී කරුණු පිළිබඳව මෙම වාර්තාව මඟින් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතික ලාංඡනය ලබා ගැනීමේ වැදගත් කම සම්බන්ධයෙන් අදාල පාර්ශව දැනුවත් කිරීම, එම ලාංඡනය ලබා දීමේ ක්‍රමවේදය තව දුරටත් ශක්තිමත් කිරීම, අනෙකුත් අදාල සම්බන්ධිත ආයතන සමඟ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, නිෂ්පාදන සහතික ලාංඡන නිකුත් කිරීම හා රසායනාගාර පරීක්ෂණ වලට අදාලව ආයතනික වශයෙන් අවශ්‍ය සම්පත් ලබාදීම හා එමඟින් එම ක්‍රියාවලීන් ඉක්මන් කිරීම යන කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාවේ නිර්දේශ ලබා දී ඇත.

## 2. පසුබිම

--------

### 2.1 හැඳින්වීම

----------

විවිධාකාර තාක්ෂණ දියුණුවීම් යටතේ ඉදිරියට ගමන් කරන ලෝකයේ විවිධ භාණ්ඩ වර්ග නිෂ්පාදනය හා හඳුන්වා දීම වේගයෙන් සිදුවේ. අළුතින් නිපදවන හා හඳුනාගන්නා භාණ්ඩ මිනිස් ශරීරයට හා පරිසරයට කොතරම් ගුණදායක ද යන්න ඇගැයීම ඉතා වැදගත් වේ.මේ සඳහා ශ්‍රී ලංකාව තුළ විවිධ අණ පනත් පනවා ඇති අතර ඒ වෙනුවෙන් විශේෂිත වූ ආයතන ද පිහිටුවා ඇත. නිෂ්පාදිත භාණ්ඩ හා ආනයනික භාණ්ඩ පරීක්ෂා කළ යුත්තේ කුමන ආයතනයක් විසින් ද යන්න භාණ්ඩ වල ස්වාභාවය අනුව තීරණය කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ද එලෙස පිහිටුවා ඇති එක් ආයතනයක් වේ.

ශ්‍රී ලංකා පාරිභෝගික සේවා අධිකාරිය හා අභ්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය මඟින් ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වන භාණ්ඩ පිළිබඳ නියෝග අංක 2064/34 දරන 2018 මාර්තු 29 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ලබා දී ඇත. මේ අතර ආහාර ද්‍රව්‍ය 48 ක් ද, ආහාර නොවන ද්‍රව්‍ය 74 ක්ද විය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති සකස් කරනු ලබන අතර එම ප්‍රමිතියට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය කර තිබේ ද යන්න සහතික කිරීම සිදු කරනු ලබයි. මෙහි දී ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්යකර ඇති භාණ්ඩ වර්ග සඳහා නිෂ්පාදකයින් විසින් SLS ලාංඡනය අනිවාර්යයෙන්ම ලබා ගත යුතුය. එසේම අභ්‍යන්තර වෙළඳ කටයුතු දෙපාර්තමේන්තුව /පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය මගින් අනිවාර්යකර ඇති භාණ්ඩ ප්‍රමිති ආයතනය විසින් අදාළ පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඊට අමතරව තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා අනෙකුත් ආයතන විසින් ද ප්‍රමිති සහතිකය ලබා ගනු ලබයි. එමෙන්ම දේශීය වශයෙන් නිෂ්පාදිත නිෂ්පාදන, වෙළඳ ද්‍රව්‍ය සෑදීමෙහි ලා යොදා ගන්නා පිරි සැකසුම් ක්‍රම සහ ව්‍යවහාර පිළිබඳ වූ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූල වන්නේදැයි නිශ්චය කරණු පිණිස පරීක්ෂා කිරීමද, සූක්ෂම උපකරණ, මිනුම් ගන්නා උපකරණ සහ විද්‍යා උපකරණ පරීක්ෂා කිරීම සහ ප්‍රමාණ ශෝදනය සඳහාත් නියමිත ප්‍රමිතවලට අනුකූල වනසේ ඒවා සම්බන්ධයෙන් සහතික නිකුත්

කිරීමද , ඒසදහා වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීමද ප්‍රමිති ආයතනයේ ප්‍රමුඛ කාර්යයන් අතර වේ.

1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් ආයතනය පිහිටුවීමේ අරමුණු ලෙස පහත කරුණු හඳුනාගෙන තිබුණි.

(අ) නිර්මාණ, වෙළඳ ද්‍රව්‍ය, නිෂ්පාදන ද්‍රව්‍ය, ව්‍යවහාර සහ ක්‍රියාවලි හා සම්බන්ධයෙන් ජාතික සහ අන්තර් ජාතික පදනම මත ප්‍රමිති පිළියෙළ කිරීම සහ ඒවා කලින් කල පරිශෝධනය කිරීම, වෙනස් කිරීම හා සංශෝධනය කිරීම සහ ඒ ප්‍රමිති පොදුවේ පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම.

(ආ) කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය කිරීම ප්‍රවර්ධනය කිරීම.

(ඇ) ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන භාවිතය ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා රසායානාගාර සහ පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ ඊට අදාළ පහසුකම් සැපයීම.

(ඈ) දේශිය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍ය සහ ඖෂධ ඇතුළු නිෂ්පාදන, වෙළඳ ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය, 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතට හෝ තත්ත්ව ප්‍රමිති හෝ අන්‍යාකාර ප්‍රමිති මෙන්ම දේශිය වශයෙන් නිෂ්පාදිත නිෂ්පාදන, වෙළඳ ද්‍රව්‍ය සැදීමෙහි ලා යොදා ගන්නා පිරි සැකසුම් ක්‍රම සහ ව්‍යවහාර පිළිබඳ වූ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූල වන්නේදැයි නිශ්චය කරණු පිණිස පරික්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම.

(ඉ) සූක්ෂම උපකරණ, මිනුම් ගන්නා උපකරණ සහ විද්‍යා උපකරණ පරික්ෂා කිරීම සහ ප්‍රමාණ ශෝදනය සඳහාත් නියමිත ප්‍රමිතවලට අනුකූල වනසේ ඒවා සම්බන්ධයෙන් සහතික නිකුත් කිරීම සඳහාත් වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම.

(ඊ) ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය හා සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීමට පහසුකම් සැලස්වීම හෝ පිළියෙල කිරීම.

(උ) මේ පනතේ අදාළ විධිවිධාන වලට අනුකූලව, සහතික ලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(ඌ) දේශිය පරිභෝජනය සඳහා වූ හෝ අපනයනය සඳහා වූ වෙළඳ ද්‍රව්‍ය, ද්‍රව්‍ය, නිෂ්පාදිත, නිෂ්පාදන සහ වෙනත් දේවල තත්ත්වය සහතික කිරීම.

(එ) අධ්‍යාපනික, උපදේශක සහ වෙනත් මාර්ග වලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඒ) ආයතනය පිහිටුවනු ලබන්නේ යම් අරමුණු සඳහාද ඒ සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තන්, සංගම් හෝ සංවිධාන සමග සහයෝගීතාවය සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඔ) වෙළඳ ද්‍රව්‍යවල, ද්‍රව්‍යවල, නිෂ්පාදනවල, උපකරණවල, පිරි සැකසුම්වල සහ ක්‍රමවල තත්ත්වය වැඩිදියුණු කිරීමට නිෂ්පාදකයන්ගේ සහ පාවිච්චි කරන්නන්ගේ උත්සාහයන් සම්බන්ධිකරණය කිරීම.

පනතේ සඳහන් මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතනය විවිධ ආකාර සේවා සැපැයීම් කටයුතු වල නිරත වුව ද කොතෙක් දුරට කාර්යක්ෂමව එම අරමුණු ලඟා කර ගෙන තිබේදැයි ඇගැයීම සඳහා මෙම වාර්තාව සකස් කර නිකුත් කරනු ලැබේ.

## 2.2 මාතෘකාව තෝරාගැනීමට හේතුව

-----------------------------------

1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා පනතේ සඳහන් අරමුණු ලඟාකරගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ක්‍රියාත්මක වීම කොතෙක් දුරට සාර්ථකද යන්න පරික්ෂා කිරීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදි.

## 2.3 විගණනය සඳහා අධිකාරි බලය

-----------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ මෙම කාර්යසාධන විගණනය කරන ලදී.

## 2.4 විගණන අරමුණු

-------------------

පහත සඳහන් අරමුණු ලඟාකර ගැනීමේ කාර්යසාධනය මෙම වාර්තාවේ නිරීක්ෂණ මඟින් සාකච්ඡා කර ඇත.

(අ) ආයතනයේ අරමුණු සාර්ථකව ඉටුකර ගැනීම පිණිස ප්‍රමාණවත් නෛතික ප්‍රතිපාදන ඇතිකර ගෙන තිබේද හා එහි නෛතික පසුබිම ඇගයීම

(ආ) ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට සරිලන පරිදි සැලසුම් ක්‍රියාවලිය ස්ථාපිත කර තිබේද

(ඇ) ආයතනයේ සැලසුම නිරවුල්ව හා ක්‍රමවත්ව කරගෙන යාම සඳහා නිසි මග පෙන්වීමක් ඇති කෙරෙන මාර්ගෝපදේශයන් පිළියෙල කර තිබේද එහි ප්‍රමාණවත් පරිදි කරුණු ඇතුළත් වී ඇත්ද යන්න

(ඈ) ප්‍රමිති සහතික නිකුත් කිරීම් ක්‍රමවේදය තුළ පාරිභෝගිකයා ආරක්ෂාවන අයුරින් භාණ්ඩ සැපයීමට හැකිවන පරිදි සහතික නිකුත් කිරීමේ ක්‍රමවේදයක් පවතීද යන්න

(ඉ) රසායනාගාර මඟින් කෙරෙන නියැදි පරීක්ෂාවන් අදාල ක්‍රමවේදය තුළ අදාල අරමුණු කරා ලඟාවීමේ හැකියාව ඇගයීම හා රසායනාගාර තුළින් පරීක්ෂා කළ නොහැකි ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂාව

(ඊ) සාධාරණ වෙළඳපොලක් නිර්මාණය වීම තුළ පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව තහවුරු වීම ඇගයී

## 2.5 විගණන නිර්නායක

---------------------

පහත සඳහන් නිර්නායක පදනම් කර ගනිමින් මෙම විගණනය සිදුකරන ලදී.

(අ) 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවීමේ පනත

(ආ) 1969 අංක 01 දරන ආනයන අපනයන පාලන පනත යටතේ නිකුත් කළ 2018 මාර්තු 29 දිනැති අංක 2064/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය

(ඇ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2010 අප්‍රේල් 01 දින නිකුත් කර ඇති GL – II – 04 අංක දරන මාර්ගෝපදේශ සංග්‍රහය

(ඈ) ආහාර, ඖෂධ හා භාණ්ඩ සම්බන්ධයෙන් පනවා ඇති ප්‍රමිතීන්

(ඉ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2019 වර්ෂයේ අයවැය හා ඊට අනුරූපීව සකසන ලද ක්‍රියාකාරී සැලැස්ම

(ඊ) 1979 අංක 01 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන

## 2.6 විගණන විෂය පථය

----------------------

ආනයන භාණ්ඩ වල ගුණත්වය ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නොවීම්, ආනායන භාණ්ඩ වල නියැදි පරීක්ෂාවන් වල කාර්යසාධනය ඇගැයීම, ප්‍රමිති ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද අලෙවි හා ප්‍රචාරණ ක්‍රියාකාරකම් , ප්‍රමිති ආයතනය හා අනෙකුත් සම්බන්ධිත ආයතන වන ශ්‍රී ලංකා රේගුව , පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය , සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යනාදි ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීම යනාදී කරුණු පිළිබඳව 2019 ජනවාරි සිට 2021 ජූනි දක්වා සිදුවූ ගනුදෙනු සම්බන්ධව පරික්ෂාකර ඇත. මෙහිදී නියැදි පදනමින් තෝරාගත් භාණ්ඩ වර්ග පිළිබඳව ගැඹුරින් පරීක්ෂාවට ලක්විය.

## 2.7 සම්බන්ධිත ආයතන

---------------------

| ආයතනය | කාර්යභාරය |
| --- | --- |
| ශ්‍රී ලංකා රේගුව | ආනයන භාණ්ඩ නිදහස් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ කටයුතු කිරීම. |
| පාරිභෝගික සේවා අධිකාරිය | ප්‍රමිති සහතිකය අනිවාර්යයෙන් ලබාගතයුතු භාණ්ඩ පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීම, භාණ්ඩ සම්බන්ධයෙන් වෙළඳපොල පරීක්ෂණ සිදුකිරීම, නිරීක්ෂණය වූ අඩුපාඩු මොනවාද, ප්‍රතික්ෂේප වූ භාණ්ඩ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග යනාදි කරුණු අධ්‍යයනය කිරීම. |

## 3. විගණන නිරීක්ෂණ

---------------------

## 3.1 ආයතනික පසුබිම හා සූදානම

--------------------------------

### 3.1.1 නෛතික පසුබිම

------------------

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවා ඇත. එසේම 1985 අංක 48 දරන ආනයන අපනයන පනත මඟින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන අපනයන පනතේ සඳහන් විධිවිධාන මඟින්ද ආනයන භාණ්ඩවල තත්ත්වය පරීක්ෂා කිරිම සඳහා වන බලතල හා කාර්යයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ලබා දී ඇත. එසේම 1979 අංක 01 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබාගැනීම අනිවාර්ය වන දේශීය වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආනයනික භාණ්ඩ සඳහා ක්‍රියාත්මක කරනු ලබන තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණ ක්‍රමය යටතේ අනිවාර්යයෙන් පරීක්ෂා කර අනුමත කළයුතු ආනයන භාණ්ඩ පිළිබඳ නිර්දේශ ලබාදී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කර තිබුණි.

මාර්ගෝපදේශ සංග්‍රහයේ Doc. No GL – 11- 04 ප්‍රකාරව පහත සඳහන් කාර්යයන් හඳුනාගෙන තිබුණි.

(I) යම් නිෂ්පාදන ආයතනයක් යම් තොගයක් ආනයනය කිරීමේ දී එම නිෂ්පාදන ආයතනය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි වූ එරට යම් රජයේ ආයතනයකින් හෝ රසායනාගාරයකින් හෝ පරීක්ෂණ ආයතනයකින් හෝ ලබා ගත් අනුකූලතා සහතිකයක් ඇත්නම් එම තොගය පරීක්ෂා කිරීමකින් තොරව විකිණීමට හෝ භාවිතයට ඉඩදෙනු ලබන අතර තොග ගෙන්වන අවස්ථා 03 කට එකක් ලෙස නියැදි පරීක්ෂාවක් කිරීම.

(II) ආනායනික තොග සම්බන්ධයෙන් අදාළ නිෂ්පාදන ආයතනය විසින් එම භාණ්ඩ අපනයනය කරන රටේ ජාතික ප්‍රමිති ආයතනයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පිරිවිතරයන්ට අදාලව අනුකූලතා සහතිකය ලබා ගෙන ඇත්නම් තොග පරීක්ෂාවකින් තොරව විකිණීමට හෝ භාවිතා කිරීමට අනුමැතිය ලබා දීමට හා ගෙන්වන අවස්ථා 03 කට එක් අවස්ථාව බැගින් නියැදි පරීක්ෂාවක් කිරීම.

(III) භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි වී අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇත්නම් පරීක්ෂා කිරීමකින් තොරව විකිණීමට හෝ භාවිතයට හෝ අනුමැතිය ලබා දී ඇති අතර තොග ගෙන්වනු ලබන අවස්ථා 05 කට එක් අවස්ථාව බැගින් නියැදි පරීක්ෂාවක් කිරීම.

(IV) නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පිරිවිතරයන්ට අනුරූපව නිෂ්පාදිත රටේ ජාතික ප්‍රමිති ආයතනයෙන් නිෂ්පාදන සහතික ලාංඡනය (Product Certification Mark) ලබා ගෙන ඇත්නම් පරික්ෂා කිරීමකින් තොරව භාණ්ඩ විකිණීමට හෝ භාවිතා කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ගෙන්වන ලබන අවස්ථා 08 කට එක් අවස්ථාවක් බැගින් නියැදි පරික්ෂාවක් සිදු කිරීමට හා වෙනත් රටක නිෂ්පාදන සහතික ලාංඡනය ඇත්නම් අවස්ථා 05 කට එක් වරක් භාණ්ඩ නියැදි පරීක්ෂාවක් කිරීම
නියැදි පරීක්ෂාවන්ගේ තරම තීරණය කිරීම සඳහා නිෂ්පාදකයාගේ, රසායනාගාරවල හා ආනයන කරුගේ අතීත ගනුදෙනු වල කාර්යසාධනයද සැලකිල්ලට ගනුලබන අතර ඒ සම්බන්ධව කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

අ) මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු වර්ගීකරණය යටතේ, "විදේශයන්ගෙන් ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා අනුකූලතා සහතික නිකුත් කරන විදේශිය රසායනාගාර, පර්යේෂණ ආයතන හෝ වෙනත් රාජ්‍ය ආයතන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි

විය යුතු වුවත් " එසේ ලියාපදිංචි වී තිබුණේ දුඹුරු සීනි සඳහා සහතික නිකුත් කරන ආයතන දෙකක් පමණි. ටින් මාළු සඳහා සහතික නිකුත් කරන ආයතන ලියාපදිංචි වී නොතිබුණි.

ආ) මාර්ගෝපදේශ සංග්‍රහයේ තෙවන වර්ගීකරණය යටතේ, භාණ්ඩ ආනයනයේදී නිෂ්පාදන ආයතන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි වී අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇත්නම් නියැදි පරීක්ෂාවකින් තොරව විකිණීමට හෝ භාවිතා කිරීමට අනුමැතිය ලබා දෙන අතර තොග ගෙන්වනු ලබන අවස්ථා 05 කට එක් අවස්ථාව බැගින් අහඹු පරීක්ෂාවන් කළ යුතුය. 2019 ජනවාරි සිට 2021 ජූනි දක්වා ආයතන 89 කින් අවස්ථා 1014 කදී දුඹුරු සීනි ගෙන්වා තිබුණු අතර කිසිදු නිෂ්පාදකයකු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි වී අනුකූලතා සහතිකයක් ලබා ගෙන නොතිබුණු අතර විස්තරාත්මක නියැදි පරික්ෂාවන් සිදු කර තිබුනේ අවස්ථා 49 කදී පමණි. 2019 ජනවාරි සිට 2021 ජූනි දක්වා නිෂ්පාදන ආයතන 36 කින් අවස්ථා 1522 කදී සන්නම් නාම 48 ක් යටතේ ටින්මාළු ගෙන්වා තිබුණු අතර නිෂ්පාදකයන් 05 දෙනකු සන්නම් නාම 20 ක් සඳහා පමණක් ලියාපදිංචි වී තිබුණි. ලියාපදිංචි නොවූ අනෙක් නිෂ්පාදන ආයතන 31 යටතේද වටිනාකම ඇමරිකන් ඩොලර් 92,205,253.54 ක් වූ ටින්මාළු බහාළුම් 4,395,416 ක් ගෙන්වනු ලැබුව ද එම ටින් මාළු සඳහා විස්තරාත්මක නියැදි පරික්ෂාවන් සිදු කර නොතිබුණි. එය ප්‍රතිශතයක් ලෙස දුඹුරු සීනි සහ ටින් මාළු සඳහා පිළිවෙලින් 5% ක් හා 0% ක් විය.

ඇ) මාර්ගෝපදේශයේ සඳහන් තොගය පරීක්ෂා කිරිමකින් තොරව විකිණීමට හෝ භාවිතයට ඉඩදෙනු ලබන අවස්ථා හතරටම අනුකූල නොවී දුඹුරු සීනි තොග ගෙන්වා තිබූ අවස්ථා 31 කදී ඇමරිකන් ඩොලර් 2,391,388.95 ක් වටිනා මෙට්‍රික් ටොන් 6323.3 ක දුඹුරු සීනි නියැදි පරික්ෂාවකින් තොරව නිදහස් කර තිබුණි.

ඇ) ආනයනික භාණ්ඩ වෙළඳපොළට නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනුමැතිය මතවන බැවින් ප්‍රමිති ආයතනයේ පරීක්ෂණ වාර්ථාව ලැබෙන තෙක් ආනයනික භාණ්ඩ වෙළඳපොළට නිකුත් නොවන බවට තහවුරු කර ගැනීම අධීක්ෂණය කිරීමට සුදුසු මාර්ගෝපදේශයක් හෝ ක්‍රමවේදයක් ආයතනය සතුව නොමැති බව නිරීක්ෂණය විය.

### 3.1.2. ආයතනික ක්‍රමවේදය

--------------------

(අ) ආනයනික භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කිරීමේ ක්‍රමවේදය පහසු කර ලීම සඳහා 2018 වර්ෂයෙදී පරිගණක දත්ත පද්ධතියක් හඳුන්වා දී ඇතත් මේ වන විටත් එම දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත්තේ සාම්පල් ලබා ගැනීමේ අවස්ථාව දක්වා ඇති දත්තයන් පමණි. සාම්පල් පරීක්ෂාවෙන් පසු එම පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සිදු කරන අනුමැතිය ලබා දීම්, නැවත නියැදි පරීක්ෂාව, භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීම හා ප්‍රති අපනයනයට නිර්දේශ කිරීම ආදිය 2021 මැයි විගණන දිනය වන විටත් අදාල දත්ත පද්ධතිය හරහා සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව යන ආයතන අතර ආනයනය කරනු ලබන සෑම භාණ්ඩ තොගයක් සම්බන්ධයෙන්ම මනා අන්තර් සම්බන්ධයක් පැවතිය යුතු වුවත් ඒ සඳහා සකස් කළ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් ගුණාත්මක බවින් තොර භාණ්ඩ වෙළඳපොළට නිකුත් වීමේ වැඩි අවධානමක් පවතින අතර එවැනි ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොළට නිකුත් වූ අවස්ථාද ශ්‍රී ලංකා රේගුවේ ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට සුදුසු ක්‍රමවේදයක් ප්‍රමිති ආයතනය විසින් සකස් කර නොතිබුණි.

(ඇ) තත්ත්වයෙන් උසස් සෞඛ්‍ය ආරක්ෂිත ආහාර ද්‍රව්‍යය මෙරටට ගෙන්වා ගැනීමට නම් ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍යය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතිකය (SLS) ලබාගැනීම අනිවාර්ය කල යුතු වුවත් ආනයනය කරනු ලබන කිසිදු ආහාර ද්‍රව්‍යයක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතිකය (SLS) ලබාගැනීම අනිවාර්ය කර නොමැති බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2019 ජනවාරි 01 දින නිකුත් කර තිබුණු LT- PC - 01 නිෂ්පාදන සහතිකය අනිවාර්ය කර ඇති භාණ්ඩ ලැයිස්තුව අනුව නිරීක්ෂණය විය.

(ඈ) නව නිෂ්පාදකයකුගෙන් භාණ්ඩ ආනයනය කරන මුල්ම අවස්ථාවේදී විස්තරාත්මක නියැදි පරීක්ෂාවක් සිදු කිරීමෙන් පසුව නැවත එවැනි පරීක්ෂාවක් සිදුකළ යුත්තේ කවර අවස්ථාවකදී ද, ඒ අතර සිදුකළ යුතු පරීක්ෂාවන් කවරේද යන්න පැහැදිලි කර සකස් කරන ලද අභ්‍යන්තර සැලැස්මක් නිරීක්ෂණය නොවීය.

### 3.1.3 ආයතනික සැලසුම්

#### (අ) ක්‍රියාකාරී හා මූල්‍ය සැලසුම්

---------------------------------

2019 දෙසැම්බර් වන විට SLS ලාංඡනය ලබා ගත් භාණ්ඩ ප්‍රමාණය ආසන්න වශයෙන් 1105 ක් පමණ වුවත් ඊට සාපේක්ෂව වෙළඳ පොළ පරීක්ෂාවන් ඉතා අඩු මට්ටමක පැවති අතර, නිෂ්පාදන සහතික ලාංඡනය ලබා ගත් භාණ්ඩ වල ගුණත්වය පිළිබඳ පරීක්ෂාව සඳහා වෙළඳ පොළ පරීක්ෂාවන් සිදු කිරිමට 2016, 2017 හා 2018 වර්ෂයන්හි ක්‍රියාකාරී සැළසුම් වලට අනුව ඇස්තමේන්තු කර ඇති පරීක්ෂාවන් ගණන පිළිවෙලින් 40 ,60 , 48 ක් හා සත්‍ය ලෙස සිදු කල පරීක්ෂාවන් ගණන 19, 39, 35 ක් විය. තවද 2019 වර්ෂය සඳහා වෙළඳ පොළ පරීක්ෂාවන් සිදු කිරිමට සැළසුම් කර නොතිබුණි. මේ හේතුවෙන් ගුණත්වයෙන් හා තත්ත්වයෙන් අඩු භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීමේ වැඩි ඉඩකඩක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

#### (ආ) මානව සම්පත් සැලැස්ම

------------------------

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මඟින් ලබාදී ඇති අරමුණු හා කාර්යයන් ඉටුකිරීම සඳහා 393 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. මෙම සේවකයන් පනතේ කාර්යයන් ඉටු කිරීමෙහිලා ඍජුව දායක වන අතර එම දායකත්වය සපයන තනතුරු 106 ක් 2021 ජූලි 31 වන විටත් පුරප්පාඩුව පවතී. මේ හේතුවෙන් රසායනාගාර පරීක්ෂණ කඩිනමින් සිදුකර වාර්තා ලබාදීම, ප්‍රමිති සකස් කිරීම, සංශෝධනය කිරීම, වෙළඳපොල පරීක්ෂාවන් තුළින් ගුණත්වයෙන් තොර භාණ්ඩ හඳුනා ගැනීම, ආනයන අපනයන පරීක්ෂණ ක්‍රමවේදය කාර්යක්ෂමව සිදුකිරීම යනාදී ආයතනික අරමුණු ඉටුකිරීම් ප්‍රමාදවීම් හා අවම වීම් නිරීක්ෂණය විය.

#### (ඇ) රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම

---------------------------------------------

රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හල්බරාවත්ත මාලඹේ ප්‍රදේශයෙන් අක්කර 03 ක ඉඩමක් මිලදී ගැනීමට සම්පූර්ණ මුදල ලෙස නාගරික සංවර්ධන අධිකාරියට රු. 168,000,000 ක් ද මීට අමතරව ඉඩම වටා වැටක් සකස් කිරීමට රු.1,165,333 ක් ද ලෙස රු. 169,165,333 ක් 2018 වර්ෂය අවසන් වන විට ගෙවීම් සිදුකර ඇතත් ඉඩමේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට 2021 ජූලි 31 වන විට ද නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ආයතන කටයුතු කරගෙන යාමේ මූලික අංගයක්වන රසායනික පරීක්ෂාවන් කාර්යක්ෂමව ඉටු කරගෙන යාම සඳහා රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම යන අරමුණද ඉටුවී නොතිබුණි. එසේම පවතින සීමිත අඩු පහසුකම් යටතේ රසායනාගාර

පරීක්ෂණ කිරීමට ආයතනයට සිදුව තිබුණ අතර ඒ හේතුවෙන් ස්වාධීන රසායනාගාර වාර්තා ලබා ගැනීමට සීමාවන් හා ප්‍රමාදයන් පැවතීම නිරීක්ෂණය විය.

තවද, රසායනාගාර පරීක්ෂාවන් සිදුකිරීම සඳහා තාවකාලික විසඳුමක් ලෙස බාහිර ගොඩනැඟිල්ලක් බද්දට ගෙන තිබූ අතර මේ සඳහා වාර්ෂිකව රු. 11,400,000 ක මුදලක් වැය කිරීමට සිදුවී තිබුණි.

## 3.2 ආයතනයේ ක්‍රියාකාරිත්වය

------------------------------

### 3.2.1 රසායනාගාර වාර්තා නිකුත් කිරීම

------------------------------------

ආයතනයේ ස්ථාපිත එක් එක් රසායනාගාර තුළ පරීක්ෂාවන් සිදුකර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම පිළිබඳව නියැදි විගණන පරීක්ෂාවක් සිදුකළ අතර නියැදිය සඳහා 2019 වර්ෂයේ ආහාර පිළබඳ රසායනාගාර පරීක්ෂණ වාර්ථා 100 ක් ද ,විදුලි උපාංග පරීක්ෂණ වාර්ථා 184 ක් ද, රසායන ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ වාර්ථා 256 ක් ද , ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ වාර්ථා 218 ක් ද, නිෂ්පාදනයට යොදා ගන්නා අමුද්‍රව්‍ය වල ගුණත්වය පිළිබඳ පරීක්ෂණ වාර්ථා 81 ක් ද ලෙස රසායනාගාර වාර්ථා 839ක් ඇතුළත් විය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ආනයන පරීක්ෂණ මාර්ගෝපදේශයේ 3.14 (1) ජේදය ප්‍රකාරව නියැදි එදිනම හෝ ඊට පසු දිනම ඉල්ලීම් පත්‍රය (Request letter) සමග අදාල රසායනාගාරයට යැවිය යුතු වුවත් දින 03 සිට දින 183 දක්වා පරාසයන් තුළ ප්‍රමාදයන් සිදු වූ අවස්ථා 481 ක් ද, නියැදි ලැබී තිබුණද පරීක්ෂණ ආරම්භ කිරීමට දින 03 සිට දින 130 දක්වා පරාසයන් තුළ ප්‍රමාද වූ අවස්ථා 359 ක් ද, නියැදි ලැබී තිබුණද පරීක්ෂණ ආරම්භ කිරීම සඳහා කාර්යය පැවරීම දින 06 සිට දින 77 දක්වා පරාසයන් තුළ ප්‍රමාද වූ අවස්ථා 130 ක් ද, විගණන පරීක්ෂාවට ලක් කළ පරීක්ෂණ වාර්ථා අතුරින් පරීක්ෂණ නිම කර වාර්තාව සකස් කිරීමට දින 03 සිට දින 105 දක්වා පරාසය තුළ ප්‍රමාද වූ අවස්ථා 169 ක් ද, පරීක්ෂණ වාර්තා සකස්කර රසායනාගාරය භාර ප්‍රධානියා විසින් සහතික කිරීම දින 05 සිට දින 41 දක්වා පරාසය තුළ ප්‍රමාද වූ අවස්ථා 72 ක් ද, කාර්යය පැවරීමේ දිනය හා පරීක්ෂණ ආරම්භ කළ දිනය අතර දින 07 සිට දින 30 දක්වා පරාසය තුළ ප්‍රමාදයන් 48 ක් ද නිරීක්ෂණය විය. මෙලෙස ප්‍රමාදවීම් හේතුවෙන් ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොලට නිකුත් වූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

### 3.2.2 නිෂ්පාදන සහතික ලාංඡනය ( SLS සහතිකය) ලබා ගැනීම

---

1992 දෙසැම්බර් 21 දිනැති අංක 746/4-1992 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දේශීය ටින් මාළු හා දුඹුරු සීනි සඳහා නිෂ්පාදන සහතික ලාංඡනය ( SLS සහතිකය) ලබා ගැනීම අනිවාර්ය වේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුව පවතින වෙළඳ නාම දත්තයන් හා දැනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මෙම සහතිකය ලබා ගෙන ඇති වෙළඳ නාම ලේඛනය පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 දෙසැම්බර් 31 වන විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ තොරතුරු අනුව වෙළඳ සන්නම් නාම 14 ක් යටතේ දේශීය වශයෙන් නිෂ්පාදිත ටින් මාළු වෙළඳපොළ වෙත නිකුත් කෙරෙන නමුත් ඒ අතුරෙන් 2021 ජූනි 30 වන විට නිෂ්පාදන සහතික ලාංඡනය ( SLS සහතිකය) ලබා ගෙන ඇත්තේ වෙළඳ සන්නම් නාම 05 ක් සඳහා පමණි. නියැදියට ඇතුළත් වූ ටින් මාළු වෙළඳ සන්නම් නාම 09 ක් සඳහා එම සහතිකය ලබාගෙන නොතිබුණි.

(ආ) වෙළඳපල තුළ අලෙවි වන දුඹුරු සීනි සඳහා වූ වෙළඳ සන්නම් නාමයන් පිළිබඳ තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු නොවන බව දන්වා එවූ අතර ශ්‍රී ලංකාව තුළ දුඹුරු සීනි නිපදවන කිසිදු දේශීය නිෂ්පාදකයකු විසින් නිෂ්පාදන සහතික ලාංඡනය ( SLS සහතිකය) තුන්දෙනෙකු ඇතත් ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය එම කිසිදු ආයතනයක් විසින් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව පෙනී යන්නේ ප්‍රමිතිය අනිවාර්ය කර ඇති භාණ්ඩ වල පවා ගුණාත්මක තත්ත්වය පිළිබඳව පරීක්ෂාවක් ප්‍රමිති ආයතනය මගින් සිදු නොවන බවයි.

(ඇ) මහජන ආරක්ෂාව හා තත්ත්වයෙන් උසස් භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීමේ දී , නිෂ්පාදන සහතික ලාංඡනය (SLS සහතිකය) ඉවත් කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ පිළිබඳව මහජනතාව දැනුවත් කිරිම පනතේ ඇතුළත් කාර්යයන් වූවත් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් (පුවත් පත්, දැන්වීම්, අන්තර් ජාල, ගුවන් විදුලි, රූපවාහිනි දැනුවත් කිරිම්) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) වර්තමානයේ දේශීය වෙළඳ පොළ තුළ මහජන ආරක්ෂාවට හා සෞඛ්‍යයට හානි කර වර්ගයේ භාණ්ඩ රාශියක් (ආහාර හා ආහාර නොවන) වෙළඳපොල තුළ පවතින බවට වෛද්‍යවරුන්ගේ ප්‍රකාශ සමාජ මාධ්‍ය, පුවත්පත් මගින් නිරීක්ෂණය වූවද, එම භාණ්ඩ සඳහා විස්තරාත්මක නියැදී පරික්ෂාවන් අනිවාර්ය කිරිමට හෝ නිෂ්පාදන සහතික ලාංඡනය (SLS සහතිකය) අනිවාර්ය කිරිමට යෝජනා ඉදිරිපත් කිරීමක් හෝ නිර්දේශ කිරීමක් සිදු කිරීමට ප්‍රමිති ආයතනය කටයුතු කර නොතිබුණි.

### 3.2.3 ප්‍රමිති භාවිතය

---------------

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති CS (Ceylon Standard) හා SLS ප්‍රමිති ගණන 4100 ක් වන අතර 2017, 2018 හා2019 යන ආසන්න වසර 03 ක ප්‍රමිත විකුණුම් පිළිබඳ ඇගයීමේදී විගණනය විසින් නිරීක්ෂණය කළ පරිදි නිකුත් කර ඇති ප්‍රමිත අතරින් ප්‍රමිත 500 – 600 අතර ප්‍රමාණයක් භාවිතයට නොගන්නා බව අනාවරණය විය. යම් කාලයක්, ශ්‍රමයක් හා පිරිවැයක් දරා ප්‍රමිති ආයතනය විසින් සකස් කරනු ලබන ප්‍රමිත ප්‍රයෝජනයට නොගැනීමෙන් ගම්‍ය වන්නේ මෙලෙස භාණ්ඩ ප්‍රමිත සම්බන්ධයෙන් නියාමනයන් සිදු නොවීම හේතුවෙන් බාධාවකින් තොරව ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොලට නිකුත් වීමේ ඉඩ ප්‍රස්ථා ලැබී ඇති බවයි. එවැනි භාණ්ඩ වලට උදාහරණ ලෙස ගෑස්,පොල්තෙල්,විවිධ විදුලි උපකරණ,කිරිපිටි ආදිය දැක්විය හැක.

### 3.2.4 අලෙවි හා ප්‍රවර්ධන කටයුතු

----------------------------

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු වලට අනුකූලව පිළියෙල කළ යුතු සංයුක්ත සැලැස්ම පදනම් කරගනිමින් සැකසිය යුතු ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව අලෙවි හා ප්‍රවර්ධන අංශය මඟින් දේශීය නිෂ්පාදකයන් හා ජනතාව දැනුවත් කිරීම සිදු කල යුතුය. 2019 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ කරන ලද ප්‍රවර්ධන කටයුතු පිළිබඳ සැලකීමේදී ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කාර්යන් ඉටු කිරීමේ ප්‍රගතිය පහත පරිදිය.

(අ) මාධ්‍ය ඇසුරුකර ගත් ප්‍රමිති ආයතනයේ කාර්යභාර්ය හා වැදගත්කම ආදී මහජන දැනුවත් කිරීම් වලට සම්බන්ධ ක්‍රියාකාරකම් 06ක් පමණක් පවත්වා තිබුණි .

(ආ) අදාල කාලය තුළ ප්‍රදර්ශන 15 කට සම්බන්ධ වී තිබුණු අතර එම ප්‍රදර්ශන කුටි තුළින් ප්‍රදර්ශනය කරන ලද්දේ මොනවාද යන්න ලිපි ගොනු මඟින් නිරීක්ෂණය නොවීය.

(ඇ) දේශීය නිෂ්පාදකයන් ප්‍රවර්ධනය යටතේ වැඩ සටහන් 30 ක් පවත්වා තිබුණු අතර එම වැඩසටහන් ඒ ඒ ආයතන වල ඉල්ලීම පරිදි අපනයන වෙළඳපොළ ඉලක්ක කරගනිමින් පවත්වන ලද වැඩසටහන් විය.

ආයතනයේ පරමාර්ථයන් වන ශ්‍රී ලංකා ප්‍රමිති සම්බන්ධයෙන් පාරිභෝගිකයන් හෙවත් මහජනතාව දැනුවත් කිරීම හා දේශිය වෙළඳපොළ තුළ කටයුතු කරන දේශීය නිෂ්පාදකයන් දැනුවත් කිරීම අවම මට්ටමක පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

අලෙවිකරණ අංශයෙන් සිදු කර ඇති වැඩසටහන් සලකා බැලීමේ දී බොහෝ වැඩසටහන් ලාභ පරමාර්ථ කොට ගත් වැඩසටහන් බව නිරීක්ෂණය විය. එනම් තම සේවාදායක පිරිස ඉහල නැංවීම සඳහා දියත් කරන ලද වැඩසටහන් වේ. එමෙන්ම සාමාන්‍යය මහජනතාව එදිනෙදා පරිභෝජනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල ප්‍රමිතිය පිළිබඳ සහතික වීමක් ලබා දෙන මූලික පාර්ශවය ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්භාර්ය තුළින් සාමාන්‍ය මහජනයා වෙත අදාළ තොරතුරු සන්නිවේදනය කරවීම ද, එම සන්නිවේදනය තුළින් යම් නිෂ්පාදනයක් තෝරා ගැනීමේ දී , මිලට ගැනීමේ දී හා පාරිභෝජනය කිරීමේදී පාරිභෝගිකයකු පූර්ණ දැනුවත් භාවයකින් යුතුව කටයුතු කල යුතු වුවත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු ප්‍රමාණවත් නොවීම මත මහජනතාවගේ එම අයිතිය අපේක්ෂිත මට්ටමින් තහවුරු වී නොතිබුණි.

## 3.3 සාධාරණ වෙළඳපොලක් සඳහා පසුබිම නිර්මාණය වීම

----------------------------------------------------------

### 3.3.1 ප්‍රතික්ෂේප වූ භාණ්ඩ

------------------------

2019 ජනවාරි 01 සිට සැත්තැම්බර් 30 දක්වා කාලයට අදාලව ආනයනය කරන ලද ,ශ්‍රී ලංකා ප්‍රමිති වලට අනුකූල නොවීම හේතුවෙන් භාවිතය හෝ විකිණීම තහනම් කරන ලද භාණ්ඩ 73 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

අ). සිද්ධීන් 73 අතුරින් සිද්ධීන් 49 ක් සඳහා පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණු අතර ඉන් සිද්ධි 7 ක් පිළිබඳව පමණක් පරීක්ෂණ කටයුතු නිමා කර තිබුණි. ඒ තුළ ප්‍රති අපනයනය කළ බවට වාර්ථා ඉදිරිපත් කර තිබුණේ අවස්ථා 02 කදී පමණි.

ආ). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2019 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා යවනු ලැබූ ප්‍රතික්ෂේපිත ලිපි සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රේගුවට මාස 09 ත් මාස 1 ½ ත් අතර කාල ප්‍රමාද වීම් සිදුවී ඇති බැව් නිරීක්ෂණය විය. (ඇමුණුම 01)

ඇ). ප්‍රතික්ෂේප ලිපි පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය වූයේ නැවත පරීක්ෂා කිරීම සඳහා නියැදීන් ලබා දෙන ලෙස ඉල්ලීම් කල ද ඒවා ලබා දීමට ආනයන කරු අපොහොසත් වී තිබුණු බවයි. ඒ අනුව එම අවස්ථාව වනවිට ද භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කර ඇති බව නිරීක්ෂණය කෙරේ.

ප්‍රමිති ආයතනය විසින් රේගුව සහ අනෙකුත් සම්බන්ධිත ආයතන වෙත යවනු ලබන ප්‍රතික්ෂේප ලිපි පිළිබඳ එම ආයතන නිසි අවස්ථාවේ ක්‍රියාත්මක නොවීම, ප්‍රමිති ආයතනය විසින් ඒ පිලිබඳව පසු විපරම් නොකිරීම, ප්‍රමිති ආයතනයේ ක්‍රමවේදය පිළිබඳ ඇතැම් ආනයන කරුවන් තුළ අවබෝධයක් නොමැති වීම, වැනි හේතු මත පරීක්ෂණ වාර්තා අසමත් භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කිරිම හෝ භාණ්ඩ ප්‍රයෝජනයට ගත් අවස්ථා නිරීක්ෂණය විය. එසේ නිදහස් කර තිබූ අවස්ථා 03 ක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **Entry NO** | **Case Number** | **භාණ්ඩ විස්තර** | **නිරීක්ෂණය** |
|---|---|---|---|
| 19/5929 | ඊඑන්එස්පී/ සීපීයූ/එම් අයිඑස්සී/ 17/2019 | 90 PLS සොකට් (Socket Outlets) | 2019 පෙබරවාරි 15 දින ප්‍රතික්ෂේප ලිපිය යවන ලද මෙම භාණ්ඩ සම්බන්ධයෙන් රේගු ආයතනය පරීක්ෂණ ආරම්භ කර තිබුණේ 2019 ඔක්තෝබර් මසදීය. ඒවන විටත් ප්‍රමිති ආයතනය විසින් 2019/02/15 දින ප්‍රති අපනයනය කරන ලෙස දන්වා යවන ලද ලිපිය පිළිබඳ සැලකිල්ලක් නොදක්වා භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කර තිබුණි. |
| 979671 | ඊඑන්එස්පී/ සීපීයූ / 2019/ 00033 | පිඟන් ගඩොල් පෙට්ටි 835 (Ceramic Tiles) | විකිණීම හෝ භාවිතයට ගැනීම තහනම් බව දක්වමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2019/05/15 දින ලිපියක් නිකුත් කරන අවස්ථාව වන විටත් අදාල තොගය භාවිතයට ගෙන තිබුණි. ප්‍රමිති ආයතනය මගින් නිර්දේශ ලබා දීමට මාස 06ක පමණ කාලයක් ගත වූ නිසාත් අදාල කාර්යය (නිවස සෑදීම) ඉක්මනින් නිම කිරීමට අවශ්‍යය වූ නිසාත් භාවිතයට ගත් බව දන්වා ඇත. 2019 ඔක්තෝබර් 02 දින රේගුව විසින් පරිභෝගික ආරක්ෂක ඒකකයට කැඳවා ඇති නමුත් පැමිණ නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| 18/2127 | ඊඑන්එස්පී/ සීපීයූ / 018/2019 | පිහන් ගඩොල් පෙට්ටි 962 | 2019/04/12 දින ප්‍රතික්ෂේප ලිපි යවා ඇති නමුත් SLSI ක්‍රියා පටිපාටි පිළිබඳ අවබෝධය නොමැති කමින් ආනයන කරු විසින් SLSI තීරණය ලැබීමට පෙර සම්පූර්ණ ආනයනික තොගය විකුණා ඇත. |

ඇ). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ අමතා යවනු ලබන ලිපි වල ප්‍රති අපනයනය විනාශ කිරීම හෝ වෙනත් කළයුතු කාර්යයක් දක්වා ඇත්නම් ඒ අනුව කටයුතු කර තිබේ ද යන්න පරීක්ෂා කල යුතු වුවත් රේගු ආයතනය විසින් ප්‍රමිති ආයතනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට භාණ්ඩ පවතින්නේ ද යන්න භෞතිකව පරීක්ෂාවක් සිදු නොකර අදල ආනයන කරුට සමාගමේ ලියාපදිංචි විස්තර , භාණ්ඩ පිළිබඳ විස්තර, ඉන්වොයිසියේ විස්තර හා ඇසුරුම් ලියවිලි (Packing List) සහ වෙනත් තොරතුරු රැගෙන රේගු ආයතනයට පැමිණෙන ලෙස දන්වා යවා තිබුණි. මෙහිදී ආනයන කරු පැමිණීමට යම් කාලයක් ගත වන අතර අවස්ථා 15 ක දී මෙම ලිපියට ප්‍රතිචාර ලැබී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. (ඇමුණුම 02 )

ඉ) . අනුකූලතා පරීක්ෂා කිරීම සඳහා ආනයනකරු විසින් අවශ්‍ය කටයුතු සම්පාදනය සිදු නොකිරීම මත භාණ්ඩ වර්ග 12 ක ගුණාත්මක භාවය පිළිබඳ වගකීම දැරිය නොහැකි බව දන්වා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ලිපි මගින් දන්වා තිබුණු අතර ඒ සඳහා මාස 02 ත් මාස 08ත් අතර කාලයක් ගත වී ඇති බැව් භාණ්ඩ ආනයනය කළ දින (Notification Date) හා පරීක්ෂණ වාර්ථාවන් නිකුත් කළ දින අනුව නිරීක්ෂණය විය. එසේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පරීක්ෂණ වාර්ථා ප්‍රමාද වීම මත රේගු කාර්යයන් ප්‍රමාද හා ප්‍රමිති ආයතනයට එම භාණ්ඩ සම්බන්ධයෙන් වගකීමක් නොමැතිවීම හේතුවෙන් ගුණත්වයෙන් තොර භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීම පිළිබඳ වැඩි අවධානමක් පවතින බව නිරීක්ෂණය කෙරේ. (ඇමුණුම 03)

### 3.3.2 භාණ්ඩ වල ප්‍රමිතියේ ගැටළු නිසා මතුවී ඇති තත්ත්වයන්

----------------------------------------------------------

නියැදි පරීක්ෂණයට ලක් වූ අත්‍යාවශ්‍ය භාණ්ඩ කිහිපයක් සම්බන්ධ අදාළ නිරීක්ෂණ පහත දැක්වේ.

#### 3.3.2.1 ගෑස් සම්බන්ධ නියාමනය

-----------------------------

නාගරික හා උපනාගරික ප්‍රදේශවල ප්‍රධානතම බලශක්ති ප්‍රභවයක් ලෙස ගෑස් භාවිතය මූලික වන අතර ඒ සඳහා වෙනත් ආදේශක නොමැත. එසේම ගෑස් සඳහා සැපයුම් කරුවන් දෙදෙනෙකු පමණක් සිටීම හේතුවෙන් ඒකාධිකාරී වෙළඳපොලක් බිහිවී ඇති අතර මිල තීරණය වීමේදී ද ඒ සඳහා ප්‍රබල බලපෑමක් ඇති කළ හැක. මෙවැනි පසුබිමක් තුළ වර්තමානයේදී ගෑස් වල ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැවතීම හේතුවෙන් අසාමාන්‍ය ලෙස ගෑස් සම්බන්ධ අනතුරු වලට මුහුණ පෑමට ජනතාවට සිදුව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරමි.

අ) ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්ය භාණ්ඩ පිළිබඳ ලැයිස්තුව පාරිභෝගික සේවා අධිකාරිය විසින් නියම කළද එම ලැයිස්තුවට ගෘහස්ත ගෑස් හෝ ගෑස් භාවිතයේදී යොදාගනු ලබන රෙගියුලේටර හා ගෑස් බටය වැනි උපාංග ඇතුළත් වී නොතිබූ අතර හිස් ගෑස් සිලින්ඩරයේ ප්‍රමිතිය පමණක් එහි ඇතුළත්ව තිබුණි. එම නිසා ගෘහස්ත ගෑස් සහ ඉහත දැක්වූ අනෙකුත් උපාංග සඳහා ශ්‍රී ලංකා ප්‍රමිත සකස්කර තිබුණද එම ප්‍රමිත භාවිතයට ගැනීම හෝ ප්‍රමිත අනුව ගුණත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නිරීක්ෂණය නොවුණි.

ආ) වෙළඳපොලට ගෑස් සපයන ප්‍රධාන ආයතනය වන ලිට්රෝ ආයතනය ගෑස් මෙරටට ආනයනය කරන අතර ආනයන අපනයන පාලක මණ්ඩලය විසින් නිකුත්කර ඇති ආනයන පරීක්ෂා කළ යුතු භාණ්ඩ ලැයිස්තුව තුළ ගෑස් ඉන්ධනය අන්තර්ගත කර නොතිබුණි. එම නිසා ආනයන පරීක්ෂණයද ගෑස් සඳහා බලපානු නොලබන බව නිරීක්ෂණය විය.

ඇ) මේ අනුව මූලික බලශක්ති ප්‍රභවයක් ලෙස ජනජීවිතයට ඉතා සමීප වී ඇති ගෑස් ඉන්ධන සම්බන්ධයෙන් නිසි පරිදි නියාමනයන් පැවතිය යුතු වූවද, ගෑස් වල සංයුතිය හා ඒවා භාවිතයේදී යොදා ගන්නා උපාංග සම්බන්ධයෙන් නියාමනයන් සිදු නොවීම හේතුවෙන් වර්තමානයේදී මෙම ඉන්ධන භාවිතය අනතුරුදායක තත්වයකට පත්ව තිබුණි.

එසේම ගෑස්වල සංයුතිය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මැදිහත්වීමට අදාල නෛතික ප්‍රතිපාදනයන් ඇතුලත් කිරීම ගෘහස්ථ ගෑස් සම්බන්ධ මෙම ගැටළු මතුවන තෙක් සිදුවී නොතිබුණු අතර පාරිභෝජන රටාව වෙනස්වීම හා තාක්ෂණිකමය වශයෙන් වෙනස්වීමට ලක්ව වෙළඳපලට නිකුත්වන භාණ්ඩ මෙන්ම නව්‍ය පාරිභෝජන භාණ්ඩවල (උදා- අත් පිරිසිදුකාරක දියර, මුව ආවරණවැනි) තිබිය යුතු ප්‍රමිත හඳුනාගැනීම සිදුකිරීම පිණිස පාරිභෝගික අධිකාරිය, ආනයන අපනයනපාලක මණ්ඩලය හා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය යන ආයතන සම්බන්ධීකරණය මඟින් කාලීනව සමීක්ෂණයට ලක්කිරීම මූලික කාර්යයක්වන අතර එවැනි ක්‍රමවේදයක් වර්තමානය තෙක් ක්‍රියාත්මක නොවුණි.

ගෘහස්ථ ගෑස් අනතුරු පිළිබඳ ගැටළු මතුවීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය වෙත ඒවායේ සංයුතිය පරීක්ෂා කිරීමේ නෛතික ප්‍රතිපාදන ලබාදී තිබුණද එම කාර්යය ඉටුකිරීමට ප්‍රමිත ආයතනය විසින් අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම කඩිනම්ව කළයුතුබව මෙහිදී නිරීක්ෂණය කෙරේ.

### 3.3.2.2 ආනයනික කිරිපිටි

--------------------

මැලිබන් කිරි නිෂ්පාදන (පුද්) සමාගම විසින් Maliban Nonfat Milk Powder යන සන්නම් නාමය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීමට 2011/07/26 වන දින අයදුම් කර ඇති නමුත් ආහාර රෙගුලාසි 2005 අනුව අදාල නිෂ්පාදනයන්හි ලේබලය සඳහා ලේබලයෙහි අඩංගු ‘ Fit & Slim Tips Enclosed ” යන්න ද, දිනපතාම මැලිබන් Nonfat කිරි වීදුරු 2 ක් පානය කිරීම නිරෝගී ශක්තිමත් මනා හැඩැති සිරුරක් පවත්වා ගැනීමටත් හොඳ අත්වැලක් වනු ඇත ( සිංහල හා ඉංග්‍රීසි ) යන්න ද, කවරයෙහි ඉදිරිපස හා පිටුපස ඇති සිහින් සිරුරු සහිත පුද්ගලයන්ගේ රූපමය ඉදිරිපත් කිරීම් ලේබලයෙන් ඉවත් කිරීම ද යන වෙනස්කම් සිදුකර ප්‍රමිති සහතිකය ලබා ගන්නා ලෙස ප්‍රමිති ආයතනය විසින් දැනුම්දීම හේතුවෙන් 2019/01/31 දිනැති ලිපිය මඟින් SLS ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය ඉදිරියට ගෙන යාම අවශ්‍ය නොවන බව නිෂ්පාදන ආයතනය දන්වා තිබුණි. කෙසේ වෙතත් ඉහත වෙනස්කම් වලින් තොරව Maliban Nonfat Milk Powder යන සන්නම් නාමය සහිත නිෂ්පාදනය මේ වන විටත් වෙළඳපොලෙහි අලෙවිය සඳහා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය.

### 3.3.2.3 පෝසිලේන්

------------

2019 අගෝස්තු මාසයේ සිට 2020 ඔක්තෝම්බර් මාසය දක්වා අවස්ථා 270 ක දී ආනයනය කල පෝසිලේන් පිඟන් භාණ්ඩ අතුරින් ගුණත්ව පරීක්ෂා ක්‍රියාපටිපාටිය අවසන් කළ අවස්ථා 152 ක දී ආනයනය කරන ලද ශුද්ධ බර කි. ග්‍රෑ. 1,566,258.40 හා වටිනාකම ඇ. ඩො. 849,623.74 වූ නියැදියක් විගණනයේදී තොරාගන්නා ලද අතර ඉන් සියයට 75 සඳහා බැර ලෝහ (Heavy Metal) පරීක්ෂාව පමණක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ප්‍රමිත අංක 1222 : 2 කොටස : 2001 (Sri Lanka Standards 1222 : Part 1 : 2001) හි පෝසිලේන් පිඟන් භාණ්ඩ ප්‍රමිතියට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සලකා බැලිය යුතු පරීක්ෂාවන් 16 ක් අක්වා ඇති නමුත් එම පරීක්ෂණ අතුරින් එක් පරීක්ෂණයක් එනම්, ලෙඩ්/ කැඩ්මියම් අන්තර්ගත පරීක්ෂාව පමණක් සිදුකර තිබුණි.

ඒ අනුව ප්‍රමිතිය මඟින් ගුණත්වය තහවුරු කිරීම සඳහා පරීක්ෂණ 16 ක් නිර්දේශ කර තිබියදිත්, එක් පරීක්ෂණයක් මත පදනම්ව ආනයනික පෝසිලේන් භාණ්ඩවල ගුණත්වය තීරණය කිරීම විගණනයේදී ගැටළු සහගත විය.

### 3.3.2.4 ධාන්‍යමය ආහාර

------------------

එසේම 2017 දෙසැම්බර් 31 දිනෙන් බලපත්‍රය අවලංගු වූ සකස් කරන ලද එක්තරා ධාන්‍යමය ආහාර නිෂ්පාදනයක් සඳහා නැවත බලපත්‍රය අලුත් කිරිමට අදාලව නියැදි පරීක්ෂාව 2018 ජූලි 15 දින සිදුකර තිබුණු අතර පරීක්ෂණ ප්‍රතිඵලය අනුව පරීක්ෂාව අසමත් වී තිබුණි. ඒ අනුව නැවත බලපත්‍රය දීර්ඝ නොකරන බව දැනුම් දී තිබුනේ බලපත්‍රය අවලංගු වූ දින සිට මාස 11 ක් ප්‍රමාද වි 2018 නොවැම්බර් මාසයේදීය. මෙම බලපත්‍රය අවලංගු කළ බවට පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය දැනුවත් කළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවිය. බලපත්‍රය අවලංගු කිරිමේ ලිපියට ප්‍රතිචාර ලෙස, මුද්‍රණය කරන ලද SLS ලාංඡනය සහිත ඇසුරුම් භාවිතා කිරිමට මාස තුනක කාලයක් අදාල නිෂ්පාදන ආයතනය විසින් අවසර ඉල්ලා තිබුණද, ප්‍රමිති ආයතනය විසින් අනුමැතිය ලබා දි තිබුණේ පවතින දෝෂයන් නිවැරදි කර නව බල පත්‍රයක් සඳහා අයදුම් පතක් ඉදිරිපත් කරන ලෙසටය. එසේ වුවත් අදාල නිෂ්පාදන සඳහා වූ බලපත්‍රය අවලංගු කළ දින සිට 2019 මැයි දක්වා මාස 17ක කාලය තුළ SLS ලාංඡනය සහිතව ඒවා අලෙවි කරන්නේද යන්න සොයා බැලීම සඳහා වෙළඳපල නියැදී පරීක්ෂාවක් සිදු කල බවට සාක්ෂි ඉදිරිපත් නොවු අතර 2019 මැයි වන විටත් SLS ලාංඡනය සහිතව අදාල නිෂ්පාදනය අලෙවිකරන බව භෞතික පරීක්ෂණ වලදී නිරික්ෂණය විය.

ඉහත සඳහන් භාණ්ඩවලට අමතරව මෙවැනි අනාවරණයන් සම්බන්ධව වැඩි වශයෙන් සමාජයේ කතාබහට ලක්වී ඇති භාණ්ඩ අතර සහල්, අනෙකුත් කිරිපිටි, සුදු සීනි, තිරිඟු පිටි, තිරිඟු ඇට, හාල් මැස්සන්, කරවල, කෘෂි රසායන, නූඩ්ල්ස්, පාම් ඔලේන්, වියළි මිරිස්, එළවළු හා පලතුරු, සනීපාරක්ෂක භාණ්ඩ, පොල්තෙල් , දැක්විය හැක.

මේ අනුව වෙළඳපලේ ඇති භාණ්ඩ වැඩි සංඛ්‍යාවක් සඳහා SLS ලාංඡනය ලබා ගැනීම අනිවාර්ය කර නොමැති වීම හේතුවෙන් ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොලට නිකුත් වීමේ ඉඩකඩ සැලසී තිබීමත්, ඇතැම් විට ප්‍රමිති ආයතනය මඟින් ස්ථාපිත කරන ලද ප්‍රමිති අනුගමනය කිරීම වෙනුවට පාරිභෝගික ආකර්ෂණය ඇති කර ගත හැකි වෙනත් බාහිර කරුණු ඇතුළත් කිරීමට ඇත. වෙළඳ ආයතන පෙළඹී තිබූ අතර ඒ සඳහා මාධ්‍ය ප්‍රබල වශයෙන් යොදාගැනීමේ ඉඩකඩ සැලසී තිබුණි. එසේම භාණ්ඩ ප්‍රමිති වලට අනුකූලව වෙළඳපොළට නිකුත් වී ඇත්දැයි යන්න තහවුරු කර ගැනීම ප්‍රමිති ආයතනය මඟින් සිදුකරනු ලබන වෙළඳපොල පරීක්ෂාවන් තුළින් සිදුකළ යුතු නමුත් එසේ නොවීම නිසා, මහජන පැමිණිලිවලින් හැර ආයතන මැදිහත් වීම මත අනාවරණය කර ගැනීම් වලින් තහවුරු කරගත හැකි ප්‍රමිති සම්බන්ධ ගැටළු මෙමඟින් මඟහැරී තිබුණි.

## 4). නිර්දේශ

---------

අ). භාණ්ඩ වල ගුණාත්මක භාවය හා සෞඛ්‍ය ආරක්ෂිත භාවය පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මාර්ගෝපදේශය ප්‍රකාරව නියැදි පරීක්ෂාවන් සිදු කිරීමටත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අනුමත පිරිවිතරයන්ට අනුකූලව පවතින බව සහතික කරගැනීම සඳහා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කර ගැනීමටත්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහතික ලාංඡනය ලබා ගැනීමට ආනයනික රටවල් දැනුවත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ආ). මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිදි භාණ්ඩ ආනයනයේදී වඩාත් විශ්වාසදායී, ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද වන, "භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි වී අනුකූලතා සහතිකයක් ලබා ගෙන තිබීම හා නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පිරිවිතරයන්ට අනුරූපව නිෂ්පාදිත රටේ ජාතික ප්‍රමිති ආයතනයෙන් නිෂ්පාදන සහතික ලාංඡනය (Product Certification Mark) ලබා ගෙන තිබීම " යන මෙම ක්‍රම දෙක මූලික කරගෙන භාණ්ඩ ආනයනය කිරීමේ ක්‍රමවේදය ආයතනය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

ඇ). ගුදම් ගාස්තු සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම මත පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමට ප්‍රථමයෙන් ආනයනකරුට තම ගබඩාව වෙත භාණ්ඩ ගෙන යාමට අවසර ලබා දෙන අවස්ථා නිරීක්ෂණය වූ අතර එසේ අවසර ලබා දෙන්නේ නම් පරීක්ෂණ වාර්තා වල ප්‍රතිඵල ලැබෙන තෙක් එම භාණ්ඩ වෙළඳ පොළට නිකුත් නොවන බවට සහතික වීම සඳහා සුදුසු ආරක්ෂිත වැඩ පිලිවලක් ප්‍රමිති ආයතනය විසින් සකස්කිරීම.

ඈ). තත්ත්වයෙන් උසස් සෞඛ්‍යය ආරක්ෂිත ආනයනික භාණ්ඩ වෙළඳපොළට නිකුත් වන බවට සහතික වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව යන ආයතන අතර මනා අන්තර් සම්බන්ධයක් පවත්වා ගැනීමට වැඩපිළිවෙළක් ක්‍රියාවට නැඟීම.

ඉ). අවශ්‍ය බඳවා ගැනීම් කඩිනම්ව හා ස්වාධීනව සිදුකිරීමට කටයුතු කිරීම.

ඊ). රසායනාගාර වාර්ථා නිකුත් කිරීම ප්‍රමාද වීම මත ආනයනකරුගේ ගබඩාවේ පවතින භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීමේ අවධානමක් පවතින අතර ඇතැම් භාණ්ඩ කල්ඉකුත් වීමේ අවධානමක් ද , ඇතැම් භාණ්ඩයන්ගේ තත්ත්වයේ වෙනස්වීම් ද ඇතිවිය හැක. ඒ හේතුවෙන් තත්වයෙන් බාල භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීමේ අවධානම අඩු කිරීම සඳහා රසායනාගාර වාර්ථා ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට කටයුතු කිරීම.

උ). ප්‍රමිති ලාංඡනය අනිවාර්ය කර ඇති සහ ප්‍රමිති ලාංඡනය ලබා ඇති භාණ්ඩ සන්නාමයන් සම්බන්ධයෙන් SLS ලාංඡනය යටතේ ලියාපදිංචි වී ඇති ද, ලාංඡනය තහනම් කර ඇති ද, ලියාපදිංචිය කල් ඉකුත් වී ඇති ද , ලියාපදිංචියකින් තොරව ලාංඡනය භාවිතා කරන්නේ ද යන්න පිළිබඳව කලින් කලට වෙළඳපොළ තුළ පරීක්ෂා කර ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා එක්ව ක්‍රියාත්මක කිරීම.

ඌ). වාර්ෂිකව ප්‍රමිති සහතිකය ලබාගත් භාණ්ඩ වර්ග මොනවාද සහ ප්‍රමිති සහතිකය ලබාගැනිම අත්‍යාවශ්‍ය භාණ්ඩ මොනවාද , අතවශ්‍ය නමුත් ප්‍රමිති සහතිකය ලබාගැනිමට අපොහොසත් වූ භාණ්ඩ වර්ග මොනවාද යන්න කලින් කළට මහජනතාව දැනුවත් කිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් ඇති කිරීම.

එ). ප්රමිති ලාංඡනය (SLS ) අනිවාර්ය භාණ්ඩ වෙළඳපොළ තුළ සුළභ කිරීමට අදාල වගකිව යුතු ආයතන වෙත යෝජනා හා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට හා බලපෑම් කිරීමට අවශ්‍ය නීතිමය බලයක් ප්‍රමිති ආයතනයට ලබා ගැනීමට කටයුතු කිරීම.

ඒ). සිදුකරනු ලබන වෙළඳ පොළ පරික්ෂාවන් ප්‍රමාණාත්මකව ඉහල නැංවීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. ප්‍රමිති ලාංඡනය ලබාදීමේදීද අදාල නිෂ්පාදකයා විසින් ලබාදෙන නියැදිවලට අමතරව වෙළඳපොලෙන් ලබාගන්නා නියැදිද පරික්ෂා කර වාර්තා ලබාගැනිම හා ප්‍රමිත සහතිකය ලබාදීමේදී එම වාර්තා සැලැකිල්ලට ගැනිම.

ඔ). ප්‍රමිති භාවිතය තුළින් තත්ත්වයෙන් ඉහළ නිෂ්පාදනයක් වෙළඳ පොළට ඉදිරිපත් කිරීමට සෑම අංශයකම නිෂ්පාදකයන් දැනුවත් කළ යුතු බව. එසේම ප්‍රමිති සහතිකය සහිත භාණ්ඩ පරිභෝජනය කිරීමට මහජනතාව දැනුවත් කිරීම.

ඕ). සාමාන්‍ය මහජනයා වෙත ලගා විය හැකි වඩා පිරිමැසුම්දායි හා කාර්යක්ෂම මාධ්‍යයන් ඔස්සේ පාරිභෝගික දැනුවත් භාවය වර්ධනය කිරීම කෙරෙහි හා දේශීය නිෂ්පාදකයන් දැනුවත් කිරීමේ වැඩ සටහන් වැඩිකිරිම කෙරෙහි අවධානය යොමු කිරීම.

ක). ආනයනික භාණ්ඩ නිෂ්පාදන අවස්ථාවේ සිට වෙළඳ පොළට යැම දක්වා භාණ්ඩයේ තත්ත්වය ආරක්ෂා කිරීමේ වගකීම ප්‍රමිති ආයතනය සතු වන බැවින් ගුණාත්මක භාවයෙන් තොර භාණ්ඩ වෙළඳ පොළට නිදහස් නොවන බවට සහතික වීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම.

ග). භාවිතයට නුසුදුසු භාණ්ඩ වෙළඳපොළට ඉදිරිපත් වීම වැළැක්වීම සඳහා ඊට වගකිව යුතු ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පැවැත්වීම.

(ඛ). ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය පනත වර්තමාන තත්ත්වයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2022 පෙබරවාරි 24 දින

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306 / 72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 01

| **එස්එල්එස්අයි අංකය** | **ප්‍රතික්ෂේප ලිපි යැවූ දිනය** | **විස්තරය** | **සිද්ධිය ලියාපදිංචි කළ දිනය** | **ප්‍රමාදය (මාස)** |
|---|---|---|---|---|
| එස්එල්එස්අයි/19/5929 | 2019/02/15 | ජාත්‍යන්තර සොකට් 90 ක් | 2019/10/14 | 08 |
| 976557 | 2019/01/16 | 80 Coils of Hot Dipped Galvanize Iron wire | 2019/10/10 | 09 |
| එස්එල්එස්අයි/19/13363 | 2019/06/03 | මොඩියුලර් සොකට් 150 | 2019/08/28 | 02 |
| එස්එල්එස්අයි /19/3811 | 2019/05/15 | පිඟන් ගඩොල් පෙට්ටි 9828 | 2019/10/06 | 04 1/2 |
| එස්එල්එස්අයි/19/10798 | 2019/06/19 | පෝසිලේන් මේස උපකරණ කට්ටල 600 | 2019/10/07 | 04 1/2 |
| එස්එල්එස්අයි /18/3200 | 2019/01/31 | 3720 Cartons 'Markfed ' Brand | 2019/06/02 | 04 |
| එස්එල්එස්අයි /19/4824 | 2019/06/12 | පෝසිලේන් මේස උපකරණ පෙට්ටි 1400 | 2019/07/17 | 1 1/2 |
| එස්එල්එස්අයි/19/11620 | 2019/06/19 | පෝසිලේන් මේස උපකරණ | 2019/10/07 | 03 1/2 |
| 974581 | 2019/08/27 | ආරක්ෂිත මෝටර් සයිකල් හෙල්මට් 3368 | 2019/10/10 | 1 1/2 |
| 978235 | 2019/04/10 | ආරක්ෂිත මෝටර් සයිකල් හෙල්මට් 1017 | 2019/05/21 | 1 1/2 |
| එස්එල්එස්අයි/19/5682 | 2019/05/21 | සෙරමික් භාණ්ඩ පෙට්ටි 215 | 2019/10/06 | 4 1/2 |
| එස්එල්එස්අයි/19/8533 | 2019/04/12 | පෝසිලේන් උපකරණ පෙට්ටි 1150 | 2019/10/08 | 06 |
| 974531 | 2019/08/27 | ආරක්ෂිත මෝටර් සයිකල් හෙල්මට් 3368 | 2019/10/10 | 1 1/2 |
| 977431 | 2019/05/24 | 2217 PCS Of Galvanized Steel Pipes | 2019/10/06 | 04 1/2 |

ඇමුණුම 02

| එස්එල්එස් අයි අංකය<br><br>(SLSI Entry no) | සිද්ධියේ අංකය<br><br>(Case Number) | සිද්ධිය ලියාපදිංචි කල දිනය (Case Registered Date) | භාණ්ඩ වර්ගය<br><br>(Item) | ආනයනකරු<br><br>(Importer) | ලිපිය ලැබුණු දිනය (Letter Sent Data) | වර්තමාන තත්වය (Current Status) |
|---|---|---|---|---|---|---|
| 19/9717 | ඊඑන්එස්පී/ සීපීයූ/050/ 2019 | 2019/07/17 | 9' වටකුරු සුප් පිඟන් පෙට්ටි 1400 ක් | ඉනොවෙන්ටික් ලංකා පුද්ගලික සමාගම | 19/07/17<br>19/07/23 | 2019/11/20 විගණන දිනය වන විටත් පැමිණ නොතිබුනි. |
| 976557 | ඊඑන්එස්පී/ සීපීයූ/ එම්අයිඑස්සී/ 18/2019 | 2019/10/10 | 80 Coils of Hot Dipped Galvanized Iron Wire | ඇට්ලස් ට්‍රේඩ් සෙන්ටර් | 2019/10/14 | එම |
| 14742 | ඊඑන්එස්පී/ සීපීයූ / 067/2019 | 2019/09/30 | උණුවතුර බෝතල්458 ක් | බරකත් ටෙක්ස් පුද්ගලික සමාගම | 2019/10/08 | එම |
| 19/6786 | ඊඑන්එස්පී/ සීපීයූ / 059/2019 | 2019/08/08 | පිඟන් ගඩොල් පෙට්ටි 360 | එස්එස් එන්ටර්ප්‍රයිස් | 2019/08/08<br>2019/09/29 | එම |
| 19/5322 | ඊඑන්එස්පී/ සීපීයූ / 009/2019 | 2019/02/27 | ආරක්ෂිත මෝටර් සයිකල් හෙල්මට් 19 | අර්ෂාඩ් එන්ටර්ප්‍රයිස් | 2019/03/14<br>2019/08/27 | එම |
| 19/13363 | ඊඑන්එස්පී/ සීපීයූ / එම්අයිඑස්සී/ 002/2019 | 2019/08/28 | මොඩියුලර් සොකට් 150 | - | 2019/08/28 | එම |
| 19/8533 | ඊඑන්එස්පී/ සීපීයූ / එම්අයිඑස්සී/ 19/2019 | | | Falms Internatinal PVT Ltd | 2019/10/08 | එම |
| 18/2172 | ඊඑන්එස්පී/ සීපීයූ/018/ 2019 | 2019/04/30 | 9' සුප් පිඟන් 550 ක් පිඟන් ගඩොල් පෙට්ටි 962 | මැක් එන්ටර්ප්‍රයිස් | 2019/08/19 | එම |
| 979671 | ඊඑන්එස්පී/ සීපීයූ/2019/ 00033 | 2019/06/10 | පිඟන් ගඩොල් පෙට්ටි 8 | Dguamic Drends | 2018/09/20 | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19/18526 | ඊඑන්එස්පී/ සීපීයූ /069/2019 | 2019/10/10 | ටින් මාළු පෙට්ටි 3680 | පී.එම්. මොහොමඩ්අලී සහ සමාගම | 2019/10/17 | ආහාර පාලකයින් විසින් නැවත පරික්ෂා කිරිමට නියමිතයි. |
| 974581 | ඊඑන්එස්පී/ සීපීයූ/071/ 2019 | 2019/10/10 | මෝටර් සයිකල් හෙල්මට් | ගයිකි හෝල්ඩින්ග්ස් | 2019/10/08 | විගණන දින විටත් පැමිණ නොතිබුණි. |
| 977431 | ඊඑන්එස්පී/ සීපීයූ/032/2 019 | 2019/10/06 | ගැල්වනයිස් පයිප්ප 2217 | මෙගා සර්විස් ලංකා පුද්ගලික සමාගම | 2019/09/23 | එම |
| 19/5493 | ඊඑන්එස්පී/ සීපීයූ/2019/ 00049 | 2019/07/12 | (6 Packets of Hot Rolled Alloy Steel wire rode | රොක් කැට් පුද්ගලික සමාගම | 2019/06/26 | එම |
| 19/3811 | ඊඑන්එස්පී/ සීපීයූ/2019/ 00034 | 2019/10/06 | කළු පිහන් ගඩොල් 1051 (2plts)1353 තද නිල් පිහන් ගඩොල්(2plts ) 1333 | සැන්ෂි ක්ලියරින් ඇන්ඩ් ට්‍රාන්ස්පෝටර්ස් | 2019/06/10 2019/09/26 2019/10/25 | එම |
| 19/8533 | ඊඑන්එස්පී/ සීපීයූ/2019/ 00019 | 2019/04/30 | 9' සුප් පිඟන් පෙට්ටි 550 ක් | Falms International PVT Ltd | 2019/05/02 2019/08/19 | එම |

ඇමුණුම 03

| එස්එල්එස්අයි අංකය | දැනුම් දීමේ දිනය Notification Date | ලිපිය ලැබුණු දිනය | භාණ්ඩ වර්ගය | ආනයනකරු | වෙළඳ නාමය සහ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 978448 | 2018/10/16 | 2019/03/15 | මහන නූල් | සී ත්‍රෙඩ් Sea Thread | 06 පෙට්ටි |
| 974556 | 2018/08/07 | 2019/03/12 | බට සවිකිරීම් | ලංකා විදුලිබල මණ්ඩලය | 11 කිලෝ ග්‍රෑම් |
| 974557 | 2018/08/07 | 2019/03/12 | පීවීසී බට | ලංකා විදුලිබල මණ්ඩලය | 02 Pkgs |
| 979979 | 2018/11/15 | 2019/01/22 | සිස්ටර්න් සවි කිරීම් | සිනෝ ට්‍රේඩින් | 156 පෙට්ටි |
| 979590 | 2018/11/09 | 2019/07/18 | පිඟන් භාණ්ඩ (මග්) | ඒ ජේ එන්ටර්ප්‍රයිස් | 864 PLS |
| එස්එල්එස්අයි /18/1699 | 2018/12/11 | 2019/06/03 | හෙල්මට් | ඩිකැත්ලන් ලංකා ස්පෝර්ට්ස් ඇක්සස් පුද්ගලික සමාගම | 1538 PLS |
| 979367 | 2018/11/05 | 2019/06/03 | උණුවතුර බෝතල් | නිව් සන් ට්‍රේඩර්ස් | නිව් සන් 180 |
| එස්එල්එස්අයි /19/9664 | 2019/03/29 | 2019/08/2 | සෙරමික් ටයිල් | අෆ්ෂින් ටයිල් | YAN 2880 Bakes |
| 980103 | 2018/11/19 | 2019/03/04 | සෙරමික් ටයිල් (බිම අතුරන) | සන් වෝඩ් ට්‍රේඩින් පුද්ගලික සමාගම | SUN WARD 4380 පෙට්ටි |
| 980105 | 2018/11/19 | 2019/03/04 | සෙරමික් ටයිල් (බිම අතුරන) | සන් වෝඩ් ට්‍රේඩින් පුද්ගලික සමාගම | SUN WARD 3830 පෙට්ටි |
| 974861 | 2018/08/13 | 2019/03/14 | ක්‍රිකට් හෙල්මට් | දිමත් ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම | 150 පෙට්ටි |
| එස්එල්එස්අයි /19/ 9019 | 2019/03/25 | 2019/07/18 | සෙරමික් ටයිල් | මැක් එන්ටර්ප්‍රයිස් | 1968 පෙට්ටි |